# රූපවාහිනී ප්‍රවෘත්ති මගින් දේශපාලකයින් මහානායක හිමිවරුන් හමුවීම විකාශය කිරීම තුළින් බෞද්ධ ඡන්ද දායක චර්යාවට සිදුවන බලපෑම පිළිබඳව විමර්ශනය කිරීම

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*අයේෂ් මධුශංඛ විජයසිංහ*[1]
*විජයානන්ද රූපසිංහ*[2]

**සංක්ෂේපය**

2014 ඡන්ද හිමි නාම ලේඛනයට අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ඡන්ද දායකයන් සංඛ්‍යාව 15,044,490 ක් වේ. ඉන් බහුතර ඡන්ද පදනමක් නියෝජනය කරන්නේ බෞද්ධ ඡන්ද දායකයින් ය. එම නිසා ශ්‍රී ලංකාවේ බෞද්ධ ඡන්ද දායකයින් මැතිවරණයකදී තීරණාත්මක සාධකයක් වේ. අතීතයේ සිට වර්තමානය දක්වා ම දේශපාලකයින් බහුතර ජන ප්‍රසාදයක් වෙනුවෙන් බුද්ධාගම වැලඳගැනීම මීට නිදසුනක් ලෙස පෙන්වා දිය හැකි ය. බෞද්ධ සමාජයේ ප්‍රධානත්වය දරන්නේ භික්ෂූන් වහන්සේ ය. ඒ අතරින් මහානායක හිමිවරුන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එම නිසා සෑම ප්‍රබල දේශපාලකයෙකු ම තම දේශපාලන දිවියේ තීරණාත්මක අවස්ථාවන්හී දී මහානායක හිමිවරුන් මුණගැසී අවවාද අනුශාසනා ලබා ගනී. එමෙන්ම රූපවාහිනී පුවත් මගින් ඒවා ජනතාගත කිරීමට ද උත්සහ දරයි. මෙලෙස දේශපාලකයින් මහානායක හිමිවරුන් හමු වීම, ආශිර්වාද ලබා ගැනීම හා උපදෙස් ලබා ගැනීම පෞද්ගලික කරුණක් සේ සැලකේ. නමුත් මෙම සිද්ධීන්ට රූපවාහිනී ප්‍රවෘත්ති තුළ සුවිශේෂී ස්ථානයක් හිමි වේ. එමගින් බෞද්ධ ඡන්දදායක චර්යාවට එල්ලවන බලපෑම පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. 2015 ජනාධිපතිවරණයේ පොදු අපේක්ෂකයා ප්‍රකාශයට පත් වීමෙන් පසු, දේශපාලකයින් මහානායක හමිවරුන් හමු වීම, රූපවාහිනී ප්‍රවෘත්ති තුළ වාර්තා කළ ආකාරය පිළිබඳ ප්‍රධාන සිදුවීම් පහක් ආශ්‍රයෙන් අන්තර්ගත විශ්ලේෂණයක් මගින් නිගමනයන්ට එළඹෙන ලදී. ශ්‍රී ලංකාවේ වැඩිම ඡන්දදායකයින් ගණනක් ජීවත් වන බස්නාහිර පළාත නියදිය ලෙස තෝරා ගනිමින්, පොදු මහජන මතය ප්‍රශ්නාවලියක් ආශ්‍රයෙන් මැන බැලීම සිදු කළ අතර ඊට අමතරව සම්මුඛ සාකච්ඡා මගින් ද අධ්‍යයනය සිදු කරන ලදී. දේශපාලකයින් මහානායක හිමිවරුන් හමු වීම වෙනුවෙන් රූපවාහිනී ප්‍රවෘත්ති තුළ වැඩි අවධානයක් යොමු වන ලෙස වාර්තා කර තිබුණි. විද්වත් සාකච්ඡා මගින් ද මහානායක හිමිවරුන් යනු බෞද්ධ සමාජයට ප්‍රබල බලපෑමක් කළ හැකි ප්‍රබල චරිත බවට මත පල විය. නමුත් මහජන මතය පිරික්සීමේදී මහජනයාගෙන් බහුතරයක් මහානායක හිමිවරුන් රූපයෙන් හෝ නාමයෙන් නොදැන සිටියෝය. තව ද දේශපාලකයින් මහානායක හමිවරු හමු වීම, රූපවාහිනි ප්‍රවෘත්ති තුළින් විකාශය කිරීම මගින් බෞද්ධ ඡන්දදායක චර්යාව වෙත බලපෑමක් සිදු නොවන බව අධ්‍යයනයේ අවසන් නිගමනය විය. මෙහිදී මහානායක හිමිවරුන් බුද්ධාගම දේශපාලනයෙන් වියුක්තව පොදු ජනතාවගේ සුභසිද්ධිය සඳහා පමණක් යෙදවිය යුතු බව මූලික යෝජනාව විය.

**මූල පද - බෞද්ධ ඡන්දදායක චර්යාව, මහානායක හිමිවරුන්, රූපවාහිනී ප්‍රවෘත්ති, ජනාධිපතිවරණය**

1. ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
ayeshmadushanka007@gmail.com